# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 443 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 13/03/2024 පැය 2000

## මාධ්‍ය නිවේදනය

### මධ්‍යම අධිවේගී මාර්ගයේ සිදු කරනු ලබන අළුත්වැඩියා කටයුත්තක් සම්බන්ධව – මධ්‍යම අධිවේගී මාර්ග අනුපාලක ස්ථානය කුරුණෑගල.

2024.03.14 වන දින සිට දින 14 ක කාලයක් තුල මධ්‍යම අධිවේගී මාර්ගයේ කිලෝමීටර් 56.9 සිට කිලෝමීටර් 57.4 දක්වා මීරිගම සිට කුරුණෑගල දක්වා කොටසේ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නියමිතව ඇත.

ඒ අනුව ඉහතින් සඳහන් කරන ලද කොටසේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන කාල සීමාව තුල මීරිගම දෙස සිට කුරුණෑගල දෙසට රථ වාහන ධාවනය කිරීමේදී කිලෝමීටර් 56.2 කණුවට පෙර ඇති මධ්‍ය හදිසි දොරටුවෙන් කුරුණෑගල දෙස සිට මීරිගම දෙසට දිවෙන දකුණු මං තීරුවට පැමිණ ඉදිරියට ගමන් කර කිලෝමීටර් 57.4 පසු කර යන විට මධ්‍යයේ ඇති හදිසි දොරටුවෙන් නැවත නියමිත මං තීරුවට පැමිණ කුරුණෑගල දෙසට ගමන් කිරීමට අවස්ථාව සලසා ඇත.

මෙම කාල සීමාව තුල කුරුණෑගල සිට මීරිගම දක්වා ධාවනය වන රථවාහන ඉහත ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරන කොටසේදී එක් මං තීරුවක් පමණක් භාවිතා කිරීමට අවස්ථාව සලසා දී ඇත.

මේ සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය මඟින් රියදුරන් හා මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**